**මහඔය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත්කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 06 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මහඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී මහඔය සතිපොළෙහි වැසිකිළි පද්ධතියක් හා රථවාහන අංගන 02 ක් ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු.4,456,010 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සභාව විසින් 2015 වර්ෂය තුලදී කැකිරිහේන සාප්පු සංකීර්ණය, පුස්තකාල පැති බැම්ම හා උණුවතුර බුබුල ආපන ශාලාව යන ඉදිකිරීම් වෙනුවෙන් වැය කර තිබූ රු.9,750,775 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්කර නොතිබුණු නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී වාහන අළුත්වැඩියාව සඳහා ටයර්, ටියුබ් සහ බැටරි සම්බන්ධයෙන් දැරූ රු. 261,800 ක වියදම ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර දැක්වීම නිසා වර්ෂයේ මෙහෙයුම් ලාභය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) දේශීය ණය සංවර්ධන අරමුදලට 2014 මාර්තු 30 දිනට ගෙවිය යුතු පොලී ශේෂයෙන් 2016 වර්ෂය තුල ගෙවූ රු.105,488 ක් සමාලෝචිත වර්ෂයේ පොලී වියදමක් වශයෙන් ගැලපීම නිසා මෙහෙයුම් අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) දේශීය ණය සංවර්ධන අරමුදලේ රු.5,805,457 ක ශේෂයෙන් රු.147,347 ක් ජංගම වගකීම් ලෙසත්, රු.5,658,110 ක් ජංගම නොවන වගකීම් ලෙසත් වර්ග නොකර සම්පූර්ණ ණය ශේෂය ජංගම නොවන වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද ව්‍යාපෘති 02 කට අදාලව ගෙවිය යුතු රු.1,636,060 ක් කර්මාන්ත ණයහිමියන් ලෙස නොදැක්වීම නිසා ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සභාව විසින් අයකර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු, 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ මුද්දර ගාස්තු වල වටිනාකම රු.281,912 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.230,100 ක් ලෙස දැක්වීම නිසා රු.51,812 ක් ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නීති,රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා රීති මාලාවේ රීති 180 | මුදල්, ගබඩා හා ආදායම එකතු කිරීමේ කටයුතු භාරව ක්‍රියාකරන නිලධාරින් තිදෙනා විසින් ඇපකර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1647 (ඉ) | වාහනවල වර්ගය හා මෝස්තරය, ලියාපදිංචි කිරීමේ අංකය, තමන්ට භාරදුන් දිනය, පැවරූ දිනය හා ඒ සම්බන්ධිත තොරතුරු දැක්වෙන මෝටර් වාහන ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති IA/2002/2 භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතුව පරිගණක 07 ක් පැවතිය ද සභාව විසින් පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.6,777,757 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක්වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,935,959 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,841,798 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පුනරාවර්තන ආදායම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදු, කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, දඩ හා වරෙන්තු හා වෙනත් ආධාර ගාස්තු යන ආදායම් මූලාශ්‍ර සියයට 0.02 සිට සියයට 36 දක්වා පරාසයක වර්ධනයක් ද, වෙනත් ආදායම්වල සියයට 11 ක අඩුවීමක් ද පෙන්නුම් කරයි.

පුනරාවර්තන වියදම් විග්‍රහයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව, සැපයුම් හා උපකරණ යන මූලාශ්‍රවල සියයට 19 සිට සියයට 46 දක්වා පරාසයක වර්ධනයක් ද, වැටුප් හා දීමනා, ගමන් වියදම්, ප්‍රවාහන සම්බන්ධතා, පොලී ගෙවීම්, ආධාර මුදල් විශ්‍රාම වැටුප් යන වියදම් මූලාශ්‍රවල සියයට 04 සිට සියයට 62 දක්වා පරාසයක අඩුවීමක් ද පෙන්නුම් කරයි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

| ආදායම් විෂය | 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් | 2016 වර්ෂයේ තථ්‍ය ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 60,000 | 61,000 | - |
| කුලී ආදායම් | 5,928,850 | 5,929,702 | 352,500 |
| බලපත්‍ර ගාස්තු | 505,000 | 408,530 | - |
| සේවා සඳහා ගාස්තු | 3,210,000 | 4,450,653 | - |
| දඩ හා වරෙන්තු ගාස්තු | 606,000 | 1,765,473 | 231,333 |
| වෙනත් ආදායම් | 252,500 | 248,223 | 136,795 |
| වෙනත් ආධාර | 17,427,528 | 13,260,641 | - |

### 2.3.2 වරිපනම් හා බදු

මහඔය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අවශ්‍ය මූලික පහසුකම් වලින් සමන්විත ප්‍රදේශයක් වුවද, සභාව විසින් මේ දක්වා වරිපනම් බදු අයකිරීමක් සිදුකර නොමැති අතර වරිපනම් සඳහා තක්සේරුවක් ලබාගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.3 වෙනත් ආදායම්

**(අ)** සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණු 07 ක් පැවතිය ද, 2009 අප්‍රේල් 19 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව දුරකථන කුළුණු සඳහා අවම වශයෙන් එක් කුළුණකට රු.20,000 බැගින් රු.140,000 ක මූලික ගාස්තුවක් අයකල යුතු වුවත්, සභාව විසින් එම ගාස්තු අයකර නොතිබුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සිට මේ දක්වා රථ වාහන නවතා තැබීමේ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.4 මුද්දර ගාස්තු

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් මුද්දර ගාස්තු වශයෙන් 2015 වර්ෂයට අදාලව රු.104,795 ක් අයකරගත යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වසර 05 කට පෙර සභාවෙන් විශ්‍රාමගත් නිලධාරියෙකුට විශ්‍රාම වැටුප් අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු. 162,274 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 05 කට පෙර සුභ සාධක සංගමය සඳහා ගෙවීම් කිරීමේ දී වැඩිපුර ගෙවන ලද රු. 15,070 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුද්දර ගාස්තු වන රු.230,100 ක් ගෙවා නොතිබුණි.

(ඈ) නිලධාරීන් 06 දෙනෙකුගෙන් 2013 වර්ෂයේ සිට අයවිය යුතු රු. 25,359 ක සේවක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වාහන 04 ක් සඳහා ආදායම් බලපත්‍ර නියමිත දිනයට ලබාගැනීමට කටයුතු නොකිරීම නිසා දඩ මුදල් වශයෙන් රු.3,000 ක් සභාවට ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට රු.33,083,469 ක් වැය කර ඉදිකරන ලද කැකිරිහේන වෙළඳ සංකීර්ණය 2016 නොවැම්බර් 10 දින කොන්ත්‍රාත්කරු විසින් සභාව වෙත භාරදී තිබුණද, අරමුණුගත කාර්යයට යොදවා නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

------------------------

ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 ප්‍රකාරව ප්‍රජාපාදක සංවිධාන සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේදී දැනට පිරිනමා ඇති කොන්ත්‍රාත්වල ඉතිරි කොටසේ මුළු වටිනාකම සහ යෝජිත කොන්ත්‍රාත්වල එකතුව රු.මිලියන 02 ක් නොඉක්මවිය යුතු වුවද සභාව විසින් ප්‍රජාමණ්ඩලයක් සඳහා රු.මිලියන 3,138,332 ක් වටිනා කොන්ත්‍රාත් 02 ක් 2016 අගෝස්තු 01 දින සිට 2016 සැප්තැම්බර් 05 යන කාල සීමාව තුල ලබාදී තිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

------------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම් අතර සියයට 02 සිට සියයට 98 දක්වා පරාසයක විචලනයක් පැවති බැවින් අයවැය ලේඛනය සඵල කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2016 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| පද්ධතිය | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|
| (අ) ගිණුම්කරණය | වත්කම් ගිණුම්ගත කිරීම. |
| (ආ) ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අයකර ගැනීම<br>ii. අතුරු ව්‍යවස්ථා පැනවීම<br>iii. ආදායම් ප්‍රභව හඳුනාගැනීම |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | වක්‍රලේඛ අනුව වැඩ ඉටු කිරීම. |
| (ඈ) ගබඩා පරිපාලනය | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට භාණ්ඩ ගබඩා කිරීම |
| (ඉ) වත්කම් පාලනය | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා ගැනීම |